# රාබු

## රැෆනුස් සැටයිවස් - (*Raphanus Sativus*)

## කුලය - කෲසිෆරී

ශ්‍රී ලංකාවේ සියළුම කෘෂි දේශගුණික කලාපවල රාබු වගා කළ හැකිය. හොඳින් ජලය බැසයන පී.එච් අගය 6.00-7.5 අතර වූ පසක් වගාව සඳහා වඩා සුදුසුය.

### බිම් සැකසීම

සෙ.මී. 30-40 පමණ ගැඹුරට පස පෙරළා හොඳින් කැට පොඩිකර ගන්න. උස් පාත්ති සකසා කාබනික පොහොර පස සමග කළවම් කරගන්න.

### නිර්දේශිත ප්‍රභේද

#### ජපන් බෝල

සුදු පැහැති රවුම් අල නිපදවයි. පත්‍ර කණ්ඩිකා වලට බෙදී ඇති අතර මැද නාරටිය ප්‍රදේශයේ බුව සහිතය. දින 45-55 දී අස්වැන්න නෙලාගත හැකිය. මැද හා උඩරට ප්‍රදේශවලට වඩා සුදුසුය.

#### බීරළු

සුදුපැහැති තර්කු හැඩති අල හටගනී. පත්‍ර බෙදී හෝ බුව සහිත ස්වභාවයක් හෝ නැත. දින 45-50 දී අස්වැන්න නෙලා ගත හැකිය. පහතරට ප්‍රදේශ සඳහා වඩා සුදුසුය.

මෙයට අමතරව “රෙඩ් රැඩිෂ්” නමින් බොහෝවිට හඳුන්වනු ලබන සලාද රාබු වර්ගයද උඩරට ප්‍රදේශවල ගොවීන් අතර ජනප්‍රියය. දින 35 - 45 දී අස්වනු නෙලාගත හැකි මෙම ප්‍රභේදයේ “ඇට බෝල” ප්‍රමාණයේ රතුපැහැති අල හටගනී. පිසීමකින් තොරව සලාද ආකාරයට ආහාරයට ගත හැකිය.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 5

### පරතරය

පේලි අතර සෙ.මී. 25 - 30 හා පැල අතර සෙ.මී. 10 කි. සලාද රාබු සඳහා සෙ.මී. 20×5

### සිටුවීම

බීජ සිටුවිය යුත්තේ පේලි දිගේය. බීජ පැලවී සතියක් පමණ ගත වූ පසුව වැඩි පැල උදුරා දමන්න.

මල් හට ගැනීම වලක්වා ගැනීම සඳහා උඩරට ප්‍රදේශවල රාබු වගා කළ යුත්තේ මාර්තු - මැයි සහ අගෝස්තු - ඔක්තෝබර් කාල වලදීය.

### පොහොර යෙදීම

| | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 90 | 110 | 65 |
| සති 3 දී | 90 | - | 65 |

### ජල සම්පාදනය

මුල් දින 4-5 දී දිනපතා ද ඉන්පසුව සෑම දින 3 - 4 වරක් බැගින් ද ජලය සපයන්න.

### වල් පැල පාලනය

එක් වරක් අතින් වල් ගැලවීම ප්‍රමාණවත්ය. උඩරට ප්‍රදේශවල සති 4 දී ද වෙනත් ප්‍රදේශවල සති 2 පමණද වල් ගලවා දමන්න.

### කෘමි පාලනය

පත්‍ර කන දළඹු වර්ගනිසා දරුණු හානියක් පවතින විට නිර්දේශිත කෘමි නාශකයක් යොදන්න.

#### පත්‍ර කනින්නා

ග්‍රිස් තැවරූ කහපැහැති පොලිතින් උගුල් වගාවේ යෙදීම, බෝගමාරුව, හානි වූ ශාක කොටස් විනාශ කිරීම, ඇසඩරැක්ටින් හෝ සයිරොමයිසින් වැනි කෘමි නාශකයක් යෙදීමද කළ හැකිය.

**කියත් පණුවා**

කුඩා පැල කපා දමයි. නිර්දේශිත කෘමිනාශකයක් වගාවට යොදන්න. වගාවේ පස අවුස්සා, පිලා අවස්ථාව විනාශ කර දමන්න.

## රෝග පාලනය

**බරවාපාද රෝගය**

පැලැටියේ වර්ධනය බාල වේ. මුල ඉදිමී විකෘති වේ.

බෝගය සිටුවීමට පෙර පසට හුනු යෙදීම, ගෝවා, රාබු වැනි බෝග එකම ඉඩමේ නිතර වගා නොකිරීම හා වල් අබ නැමති පැලැටිය ඉඩමේ වැඩීමට ඉඩ නොදීම වැනි ක්‍රියා මගින් රෝගය පාලනය කරගත හැකිය.

## අස්වනු නෙලීම

නියම අවස්ථාවේදී අස්වනු නෙලන්න. අස්වැන්න ප්‍රමාද වී නෙලීම මගින් අල වල ගුණාත්මය අඩුවේ.

## අස්වැන්න

| | | | |
|---|---|---|---|
| ජපන් බෝල | - | හෙක්. ටොන් | 40 - 50 |
| බීරළු | - | හෙක්. ටොන් | 20 - 30 |

## අස්වැන්න සැකසීම

අලවල ප්‍රමාණය අනුව අස්වැන්න ශ්‍රේණි කරන්න. වාතාශ්‍රය හොඳින් ලැබෙන පරිදි අසුරා මිටිබැඳ වෙළඳ පොලට යවන්න.